# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2048/2 - 2017 දෙසැම්බර් මස 04 වැනි සඳුදා - 2017.12.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ඡන්ද විමසීම් කාල සීමාව තුළදී රජයට හෝ රාජ්‍ය සංස්ථාවලට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළ පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධනයට නැතහොත් අගතියට හේතුවන පරිදි හෝ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමේ කාර්යයට බාධාවන පරිදි හෝ යොදා ගැනීම වැළැක්වීම සඳහා වූ විධාන**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (4) (අ) අනුව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් සාදනු ලබන, රජයට හෝ රාජ්‍ය සංස්ථාවකට අයත් යම් නිශ්චල හෝ චංචල දේපළ, ඡන්ද විමසීමේදී පක්ෂ/කණ්ඩායම්/අපේක්ෂකයින් ප්‍රවර්ධනයට නැතහොත් අගතියට හේතුවන පරිදි හෝ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමට බාධාවන අයුරින් යොදා ගැනීම වැළැක්වීම සඳහා මතු සඳහන් විධාන මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

| | | |
|---|---|---|
| මහින්ද දේශප්‍රිය | එන්. ජේ. අබේසේකර | එස්. රත්නජීවන් එච්. හූල් |
| සභාපති | සාමාජික | සාමාජික |
| මැතිවරණ කොමිෂන් සභාව | මැතිවරණ කොමිෂන් සභාව | මැතිවරණ කොමිෂන් සභාව |

2017 දෙසැම්බර් මස 04 වැනි දින,
සරණ මාවත,
රාජගිරිය,
මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104(ආ)(4)(අ) ව්‍යවස්ථාව අනුව "මැතිවරණයක් පවත්වනු ලබන කාල පරිච්ඡේදය තුළ දී, රජයට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළක්" යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ කෝරාපක් කර ගැනීම ප්‍රවර්ධනය කිරීමේ හෝ වළක්වාලීමේ කාර්යය සඳහා යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ විසින් භාවිතා කිරීම තහනම් කිරීමේ බලය මැතිවරණ කොමිෂන් සභාවට හෝ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාට අයත්ය. එම ව්‍යවස්ථාවේ (ආ) අනු ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් කරනු ලබන නියමයන් ක්‍රියාත්මක කිරීමට රජය සතු දේපළ භාරව සිටින සියලුම නිලධාරීන් බැඳී සිටී. එබැවින් අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන් ඇතුළු සියලුම රජයේ නිලධාරීන් මෙම විධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය. එමෙන්ම ස්වකීය පාලනය යටතේ ඇති සියලුම රාජ්‍ය නිලධාරීන් මෙම නියමයට අනුකූලව ක්‍රියා කරන බවට ආයතන ප්‍රධානීන් වගබලා ගත යුතු ය. මෙම නියම, සියලුම රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය බැංකු, රාජ්‍ය විශ්වවිද්‍යාල යනාදී සියලුම රජයේ ආයතනවලට හා රජයට පවරා ගෙන ඇති සමාගම්වලට ද බලපැවැත්වේ.


1A - SH 1047 — 1250 (2018/01)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

02. නිලධාරීන්

i. රජයේ නිලධාරීන්ගේ හැකියාව, දැනුම හා ඔවුන්ගේ කාලය ද රාජ්‍ය දේපළක් වන හෙයින්, කිසිදු රාජ්‍ය නිලධරයකු ස්වකීය කාර්යාල වේලාව තුළ හෙවත් රාජකාරියට වාර්තා කර ඇති වේලාව තුළ හෝ රාජකාරි නිවාඩු ලබාගෙන ඇති විට හෝ කාර්යාලය තුළ හෝ කාර්යාලයෙන් බැහැරව දේශපාලනමය ප්‍රවර්ධන කටයතුවල නොයෙදිය යුතු ය. දේශපාලන අයිතිවාසිකම් අහිමි නිලධාරීන් නිවාඩු ලබාගෙන හෝ දේශපාලනමය කාර්යයන්හි නිරත නොවිය යුතු ය. දේශපාලන අයිතිවාසිකම් හිමි නිලධාරීන්ට වුවද කාර්යාල වේලාව තුළ දේශපාලනමය කාර්යයන්හි නිරත විය හැක්කේ පූර්වයෙන් අනුමත කර ගත් පෞද්ගලික හෝ විශේෂ නිවාඩු මත පමණකි.

ii. කිසිදු නිලධාරියකුට හෝ සේවකයකුට දේශපාලනමය කටයුතු සඳහා රාජ්‍ය දේපළ එනම්, වෙනත් රජයේ නිලධාරීන්, වාහන, ප්‍රචාරක උපකරණ, මුද්‍රණ යන්ත්‍ර දුරකථන පහසුකම් යනාදී රජය සතු කිසිවක් භාවිතා කිරීමේ හිමිකමක් නැත. එසේ කිරීම සම්පූර්ණයෙන්ම තහනම් වේ.

iii. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මගින් පත් කර ඇති කොමිෂන් සභාවල බලතල යටතේ විධිමත් ලෙස කරනු ලබන බඳවාගැනීම්, පත්වීම්, උසස්වීම් හා මාරු කිරීම් හැර මෙම කාල සීමාව තුළදී රාජ්‍ය ආයතනයන්හි කිසිම ආකාරයක බඳවා ගැනීම්, පත්වීම් හා උසස්වීම් කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව සිදුකිරීමෙන් වැළකී සිටිය යුතු ය.

iv. ඡන්ද විමසීම් පැවැත්වීමට නියමිත ප්‍රදේශවල ඡන්ද විමසීම් රාජකාරි සඳහා යොදවා ගැනීමට අපේක්ෂිත රජයේ විද්‍යාලයන්හි ගුරුවරුන්, විදුහල්පතිවරුන් ඇතුළු සියලුම රජයේ නිලධාරීන්ගේ සාමාන්‍ය ස්ථාන මාරුවීම් නාමයෝජනා දැන්වීම් දින සිට ඡන්ද විමසීම අවසන් වී සති දෙකක් යන තුරු අත්හිටුවිය යුතු ය. ඡන්ද විමසීම් රාජකාරි සඳහා යොදවනු නොලබන රජයේ හෝ රාජ්‍ය සංස්ථා නිලධාරීන් හෝ ඡන්ද විමසීම් කාල සීමාව තුළ ස්ථාන මාරු කිරීමේ දී දේශපාලන හේතූන් මත එකී ස්ථාන මාරුවීම් සිදු නොකළ යුතු අතර එසේ සිදු කරනු ලැබූ බවට පැමිණිලි නොලැබෙන සේ අදාළ ස්ථාන මාරු කිරීම් සිදුකිරීම සියලුම බලධාරීන්ගේ වගකීම වේ. විනය නියෝග මත සිදු කෙරෙන ස්ථාන මාරුවීම් සඳහා මෙම නියමය බල නොපැවැත්වෙන අතර විශේෂ අවස්ථාවලදී හෝ සේවා අවශ්‍යතා මත ස්ථාන මාරුකිරීම් සිදු කිරීමට අවශ්‍ය නම් ඒ පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කර අනුමැතිය ලබාගත යුතු ය.

v. ඡන්ද විමසීම් ප්‍රකාශයට පත් කිරීමට පෙර ආරම්භ කර තිබූ නිලධාරීන් බඳවා ගැනීම්/උසස් කිරීම්වලට අදාළ දීප ව්‍යාප්ත වැඩපිළිවෙලක් හෝ අභ්‍යන්තර උසස් කිරීමේ වැඩපිළිවෙලක් කල් දැමීමකින් තොරව ක්‍රියාත්මක කළ යුතු යයි අමාත්‍යාංශ ලේකම්වරයා හෝ ආයතන ප්‍රධානීන් අපේක්ෂා කරන විට දී හා සමස්ත දිවයිනටම බලපාන පරිදි රාජ්‍ය සේවයට හෝ රාජ්‍ය ආයතනවලට අදාළව සිදු කෙරෙන වෙනත් බඳවා ගැනීම්/උසස් කිරීම් විධිමත් ව හා දේශපාලන මැදිහත්වීම්වලින් තොරව කෙරෙන බවට අදාළ බලධාරීන්ට නිසැක විය හැකි විටදී ඒ සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ එකඟතාව ලබාදිය හැකි ය. එවැනි අවස්ථාවලදී ඒ සඳහා කොමිෂන් සභාව වෙත ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු ය.

vi. සනීපාරක්ෂක, පිරිසිදු කිරීම් හා නඩත්තු කටයුතු බිඳවැටීම වැළැක්වීම සඳහා හා අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙන යෑම සඳහා ප්‍රාදේශීයව හෝ පළාත් බදව හෝ රජයට සේවකයන් බඳවා ගැනීම් සිදු කරන්නේ නම්, එවැනි බඳවා ගැනීම් වුවද කොමිෂන් සභාවේ එකඟතාව මත සිදු කළ යුතු අතර කිසිදු දේශපාලනමය මැදිහත්වීමකින් තොරව විනිවිද බවින් යුතුව එවැනි කටයුතු සිදු කිරීමේ වගකීම අදාළ නිලධාරීන් වෙත පැවරේ.

03. උත්සව, ජංගම සේවා සහ වෙළඳ ප්‍රදර්ශන

(i) උත්සව

ඡන්ද විමසීම් කාලය තුළ රජයේ මුදල් වැය කරමින් පවත්වනු ලබන විවිධ ආකාරයේ මුල්ගල් තැබීම්, විවෘත කිරීම්, ජනතා අයිතියට පැවරීම් වැනි උත්සව දේශපාලනඥයන්ගේ සහභාගීත්වයෙන් සිදුකෙරෙන අවස්ථාවලදී ඡන්ද විමසීමට අදාළව නොයෙකුත් මතිමතාන්තර ඔවුන් වෙතින් ප්‍රකාශ වන බැවින් සහ මෙවැනි අවස්ථා උත්සවාකාරයෙන් පැවැත්වීම හරහා යම් පක්ෂයක්/කණ්ඩායමක් හෝ අපේක්ෂකයකු ප්‍රවර්ධනය කිරීමක් හෝ වෙනත් පක්ෂයකට/කණ්ඩායමකට/අපේක්ෂකයකුට අගතියක් සිදු විය හැකි හෙයින්, මෙම ඡන්ද විමසීම් කාලය තුළ එබඳු උත්සව හා කාර්යයන් සංවිධානය කිරීමෙන්, පැවැත්වීමෙන් වැළකී සිටිය යුතු ය. ඡන්ද විමසීම් නිවේදනය නිකුත් කිරීමට පෙර දින නියම කරන ලද එවැනි උත්සව අවලංගු කිරීමට හෝ කල් තැබීමට හැකියාවක් නැත්නම් එවැනි උත්සව පිළිබඳ මැතිවරණ කොමිෂන් සභාව වෙත වාර්තා කර උපදෙස් ලබා ගත යුතු වේ. යම් හෙයකින් රජයේ මුදල වැය කරමින් මෙවැනි උත්සව පවත්වනු ලැබුවහොත් එවැනි අවස්ථාවකදී පක්ෂ/කණ්ඩායම්/අපේක්ෂකයන් ප්‍රවර්ධනය හෝ අගතියට පත් කිරීම් සිදුවහොත් ඒ පිළිබඳව උත්සවය සංවිධානය කරන ලද නිලධාරීන් වගකිව